# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/9 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ඩබ්. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වැනි දින,
නුවරඑළියේ දී ය.

### නියෝග

1. මෙම නියෝග 1975 අංක 4 දරන හදිසි අවස්ථා (බන්ධනාගාර රීති) නියෝග යන නමින් හඳුන්වනු ලැබේ.

2. බන්ධනාගාර ආඥාපනතේ හෝ වෙන යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ නියෝග ක්‍රියාත්මක විය යුතුය.

3. ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක් බන්ධනාගාරයක් විය යුතු යයි ලේකම් විසින් නම් කළ හැකි අතර බන්ධනාගාර ආඥාපනතේ හෝ වෙන යම් ලිඛිත නීතියක කාර්යයන් සඳහා ඒ ස්ථානය එපරිද්දෙන්ම බන්ධනාගාරයක් ලෙස සැලකිය යුතුය.

4. බන්ධනාගාර ආඥාපනතේ 94 වැනි වගන්තියේ සඳහන් කරුණු සියල්ල හෝ එයින් කිසිවක් පිළිබඳවත් රීති අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි ලේකම් විසින් සලකනු ලබන බන්ධනාගාරවලට හෝ සිරකරුවන්ට සම්බන්ධ වෙන යම් කාරණයක් පිළිබඳවත් ලේකම් විසින් රීති පැනවිය හැකිය.

5. මේ නියෝගවල " ලේකම් " යන්නෙන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් අදහස් කෙරෙයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

39A— ඊ 13573—2,100 (75/04)